# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 68 — 1973 ජූලි 13 වැනි සිකුරාද — 1973.07.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (II ආ) වැනි ඡේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 871 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 892 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම් විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 889 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | 893 |
| කොටුපල් වරෙන්තු හා වෙනත් වරෙන්තු විකිණීම .. ... | — | විවිධ දැන්වීම් ... ... .. | 895 |


සැළකිය යුතුයි.—(i) බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 ජූනි 29 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී, (ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 21 දරන මුද්දර (සංශෝධන) පනත 1973 ජූලි 13 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**1973 ජූලි මස 01 වැනි දින සිට 1973 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා මීගමු බන්ධනාගාර කර්මාන්ත අංශයට අමුද්‍රව්‍ය සැපයීම**

පහත අත්සන් කරනු ලබන මා විසින් මීගමු බන්ධනාගාරීය කර්මාන්ත අංශයට 1973. 08. 01 සිට 1973. 12. 31 වැනි දින දක්වා කාලය තුළ දී පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා ටෙන්ඩර් 1973 ජූලි මස 31 වැනිදා පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණකි.

3. ටෙන්ඩර් හා ආරක්ෂක මුදල්, තැන්පත් මුදල් පහත සඳහන් ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙසේ විය යුතු යැයි තීරණය කොට ඇත :—

| සැපයුම් | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප තැන්පත් මුදල |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| (අ) මුස්න හා ඉදල් තැනීමට යෝග්‍ය මිටි ... | 25 0 | 300 0 |

4. **විශේෂ විස්තර.**—මීගමු බන්ධනාගාරයට ගෙනවිත් භාර දිය යුතුයි :—

(අ) **මුස්න හා ඉදල් තැනීමට යෝග්‍ය මිටි.**—ඇවට කැබැල්ල, ඇට්වෙට්ටියා සහ වෙනත් සවි ඇති ලී වර්ගයේ ඇද නැති, අවශ්‍යතාවය අනුව දිග අඩි 5 ක් සහ අඩුම වට ප්‍රමාණය අඟල් 3 ක් සහ වැඩිම වට ප්‍රමාණය අඟල් 4 ක් විය යුතුයි.

5. ඉහත නම් කර ඇති ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරන විට එහි නාම සහ නම ලිපිනය ලියා ලියුම් කවරයක බහා පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. ආදර්ශක නොමැතිව ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ඇත.

6. පහත සඳහන් ආයතනයන්ගෙන් නියමිත ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කිරීමේදී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතන.

(ආ) වෙනත් ආණ්ඩුවට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන.

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති.

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

7. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ ඒ සඳහා නියමිත ෆෝර්මයන් මගින් පමණකි. එය ලබාගත හැක්කේ 1973 ජූලි මස 30 වැනි දින පස්වරු 2.30 දක්වා, ඉහත සඳහන් ද්‍රව්‍ය සඳහා මුදල් තැන්පත් කර ලබාගත් රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් බවත්, මේ ටෙන්ඩර් තැන්පත් මුදල් කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කාර්යාලයේදීත්, කොළඹින් පිටතදී ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කළ හැකි බවත්, සලකනු ලැබේ.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පලවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරු යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියන් බව අදහස් කෙරෙන අතර, එවැන්නක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්නා සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු කෙරෙහි එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත්‍රපොත, චැක්රෝල් පොත්, පෙරෙව්වු පොත් සහ අනිකුත් ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂාකර බැලීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයකට තැපෑලෙන් යැවුවහොත් හෝ ඔහු අතටම භාර දුන්නා සේ සලකනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරුවෙකු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥාපනතෙහි (117 වෙනි අධිකාරිය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. කිසියම් සේවකයෙකු සේවයේ යෙදීමට අහිතකර යයි රජය සලකනු ලබන විටක හා කිසියම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතුවේ.

17. තනි වශයෙන් හෝ වෙනත් අයෙකුගේ නමක් සමග රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි නම් සඳහන් කිසිවෙකු සමඟ හෝ තමාට සැහේ යයි හැඟී යන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. එකී එකී ගොවිපලවල කළමනාකරුවන්ගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගත හැක.

එච්. ඊ. නානායක්කාර,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ.
(කෘෂිකර්ම අධ්‍යක්ෂ හා ගොවිපල).

7–262—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කොටුකච්චිය සත්ව ගොවිපලේ කජු ඇට විකිණීම

කොටුකච්චිය සත්ව ගොවිපලේ ඇති පහත සඳහන් කජු ඇට තොගය විකිණීම සඳහා පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973.8.3 ප.ව. 2.30 දක්වා සීල් තබා එවන ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

නො : 1 කජු ඇට 16,750

නො : 2 කජු ඇට 1,10,600

2. ඕනෑම කච්චේරියක හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රු. 10ක් තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සිය පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය පිළිබඳ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂට ඉදිරිපත් කර 1973.08.02 දින දහවල් 12 වන තෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර්පත් ලබාගෙන අනුපිටපතද සහිතව සම්පූර්ණ කර ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

3. වැඩි විස්තර කොටුකච්චිය සත්ව ගොවිපල් කළමනාකාර තැනගෙන් හෝ මගෙන් දැනගත හැකි අතර, කාර්යාල වේලාවන්හිදී මෙම කජු ඇට තොගය එම ගොවිපලේ ගබඩාවේදී පරීක්ෂාකර බැලිය හැකිය.

අ. බණ්ඩාරනායක,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(සත්ව පාලන හා සෞඛ්‍ය).

1973.06.30 දින,
පේරාදෙනිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ දීය.

7–320—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොළොන්නරුව රජයේ බීත්තර වී ගොවිපලේ 1973 යල් කන්නයේ ගොයම් කැපීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් ගොවිපලේ පහත සඳහන් කොටස්වල ගොයම් කැපීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1973.08.10 වෙනි දින පෙ.ව. 10.30 දක්වා භාරගනු ලැබේ.

1. ඒ ඒ කොටස්වල ගොයම් කැපීම පහත දැක්වෙන දිනයන්හිදී ආරම්භ කළ යුතුය:—

| කොටස | වී වර්ගය | වපසරිය අක්කර | අස්වැන්න නෙලන දින | දිනකට අවසන්කළ යුතු අක්කර ගණන |
|---|---|---|---|---|
| පරීක්ෂණ | ... බී. ජී. 11/11 | ... 18 | ... 1973 සැප්තැම්බර් 15 | ... 10 |
| 1ඒ කොටස | ... බී. ජී. 11/11 | ... 35 | ... එම 25 | ... 10 |
| කො. 2 ... | ... බී.ජී. 11/11 | ... 45 | ... එම 20 | .... 10 |
| ගබඩා කොටස | ... අයි. ආර්. 8 | ... 10 | ... එම 18 | ... 10 |
| එම | ... එච්. 4 | ... 5 | ... එම 10 | ... 5 |
| අළුත් වැව කොටස | ... බී. ජී. 34/8 | ... 16 | ... 1973 අගෝස්තු 28 | ... 8 |
| වැව බී. කොටස | ... බී. ජී. 34/6 | ... 20 | ... 1973 සැප්තැම්බර් 5 | ... 8 |
| | | 149 | | |

2. ටෙන්ඩර්කරු විසින් භාරගන්නා ලද අක්කර ප්‍රමාණය කිසියම් හේතුවක් ඇතොත් අඩුකිරීමට ටෙන්ඩර් මණ්ඩලයට බලය ඇත. එමෙන්ම වර්ෂාව හෝ වෙනත් නොවැලැක්විය හැකි කරුණක් ඇති වුවහොත් ගොයම් කැපීම ආරම්භ කිරීමට නියමිත දිනට පෙර හෝ පසුව හෝ දිනයක් නියම කිරීමට අදාල ගොවිපලේ අධිකාරිට බලය ඇත. ගොයම් කපන දෑකැති ආදිය ටෙන්ඩර්කරු විසින් සපයා ගත යුතුය.

3. දිනකට අක්කර 10 ප්‍රමාණයේ ගොයම් කපා යාර 100ක් පමණ ඈතින්වූ ස්ථානයකට ගෙන ගොස් ගොවිපල අධිකාරි ගේ උපදෙස් අනුව ගොඩ ගැසිය යුතුය. මෙය වී වැටෙන්නට නොදී කළ යුතුය. 6" කට නොවැඩි ඉපනැල්ලක් කුඹුරේ නොතිබිය යුතුය. ගොයම් කැපීමෙන් පසු කොල ගැහීමේදී වැටුනු ගොයම් කරල් හෝ උප්පිටි ආදිය හොඳින් අහුලා කොලයට එක් කළ යුතුය.

4. නියමිත කාලය තුළදී ගොයම් කැපීම කළ යුතු අතර, නියමිත දිනය ඉක්මවා පමාවන සෑම දිනයක් සඳහාම වන්දි මුදලක් ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය. මම මුදල කොතෙක් ද යන්න තීරණය කිරීමේ බලය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ඉහත සඳහන් කර ඇති දිනකට නියමිත අක්කර ප්‍රමාණය කැපීමට ටෙන්ඩර්කරුට හැකියාවක් තිබිය යුතුය. එමෙන්ම ගොවිපලේ අධිකාරි සෑහීමකට පත්වන අයුරු එය ඉටුකළ යුතුවේ. කපන ලද ගොයම් වලට වැස්සෙන් වන හානියක් නොපැමිණිය හොත් දින දෙකක් ඇතුළත ගොඩ ගැසිය යුතුය. වැස්සෙන් බාධාවක් ඇතිවුවහොත් ගොයම් කොළ කොතැනක ගොඩගැසිය යුතු දැයි ගොවිපල අධිකාරින් විසින් තීරණය කරනවා ඇත. ටෙන්ඩරුගේ පැහැර හැරීමෙන් හෝ නොසැලකිල්ලෙන් හෝ වී වලට හානියක් සිදුවේ නම්, එම හානියේ වටිනාකම ටෙන්ඩර්කරුගෙන් අයකර ගනු ලැබේ.

5. පේරාදෙණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ගොවිපල් කාර්‍යාලයේ පරිපාලන නිලධාරි නැතගෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුය. සියලුම ටෙන්ඩර් පත්‍ර දෙපිටපතකින් යුක්තව තිසිසේ පුරවා සීල් තබා '' සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම ගොවිපල් අංශය, පේරාදෙණිය '' යන්න ලියා ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ '' පොළොන්නරුව ගොවිපලේ ගොයම් කැපීමේ ටෙන්ඩර් '' යන්න ලියා එවිය යුතුය. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනයද එහි සඳහන් කළ යුතුය.

6. 1973.08.09 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ඒ නිකුත් කිරීම කරනු ලබන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25 බැගින් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියක් පේරාදෙණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ගොවිපල් කාර්‍යාලයේ පරිපාලන නිලධාරි තැනට ඉදිරිපත් කළ පසුවය. මෙම මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම ප්‍රධාන කාර්‍යාලයේ හෝ කළ හැක. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව දන්වා දින 07 ක් ඇතුළතදී අවශ්‍ය ඇප තැබීමට හා ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට නොහැකි වුව හොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල් සියල්ල රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයට ඇතුළත් කිරීමටද ඉඩ තිබේ.

7. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් ටෙන්ඩර් කරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනාළ එවා අතින්ම භාර දිය යුතුය. ලියාපදිංචි, තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුන බව එවා විවෘත කළ දිනයේම ටෙන්ඩර්කරුට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුන හොත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් ඒ ගැන විමසිය යුතුය.

8. ටෙන්ඩර්කරුට උවමනානම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ ඉදිරියේ පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වීමට නියමිත දින එකී වේලාවෙදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ඒවා විවෘත කරනු ලැබේ.

9. නියමිත පෝරමයේ ලියා නැති නැතහොත් එකී නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තින්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කලහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූ පිළිගනු ලැබුවාවූද දේවල මුළු ගණනින් 5% ඇප මුදලක් තැන්පත් කිරීමටත් ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුට නියම කරනු ලැබේ. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරු මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවටද ඇතුළත් වනවා ඇත.

11. ගිවිසුම පත්‍රවල ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය.

12. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුය.

13. ටෙනඩර්පත්‍රයේ සඳහන් සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 11 කටවත් වෙනස් නොවන එවා විය යුතුය.

14. යම් කිසි ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමත් හෝ ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේ හෝ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනු ඇත.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකුගේ නම සමඟ නම ඇතුළත් ව හෝ ටෙන්ඩර් මණ්ඩලයට සැහේයයි පෙනී යන හේතුන් පිට ටෙන්ඩර් මණ්ඩලය එකඟ නොවන කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුව බැඳෙනු නොලැබේ.

16. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් හෝ ඔහුගේම අතට භාර දුන්නා සේ සලකනු ලැබේ.

17. කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් නියුක්ත කළ යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩ කරන ප්‍රදේශයේ සිටින අය අතුරිනි. කොන්ත්‍රාත්තුවේ කොන්දේසි සපුරාලීමට ටෙන්ඩර් කරු යම්කිසි විදියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතුව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට ටෙන්ඩර්කරුට බලය දිය හැකිය. එවැනි ලිඛිත බලයක් හා එකඟතාවයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් සේ සලකනු ලැබේ. ලාංකික යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රට වැසියකු අදහස් කරන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වේ. කොන්ත්‍රාත්තුවේ යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද කම්කරු ගෙවීම් සම්බන්ධයෙන් දැනට බලපවත්වන මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට තෝරාගත් ටෙන්ඩර්කරු එකඟ විය යුතුය. කොන්ත්‍රාත්තුවේ වැඩ කෙරෙහි යොදනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔවුන්ගේ පත පොත, චෙක් රෝල් පොත් පෙරෙට්වු පොත් හා අනිකුත් ලිපි ලේඛණද පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට තෝරාගත් ටෙන්ඩර්කරු බැඳී සිටිය යුතුය.

18. 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥාපනත අධිකාර 117 යටතේ සේවකයෙකු විසින් හෝ සේවයකු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන කවර වන්දියක් සම්බන්ධයෙන් වුවද රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරු වග බලා ගත යුතුය.

19. තැපෑලෙන් ටෙන්ඩර් ආකෘති ඉල්ලා කුවිතාන්සි එවන අයට ඒ දිනයේම ටෙන්ඩර් ආකෘති පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබේ. එහෙත් ඒවා කලට වේලාවට ඔවුන්ට නොලැබුනහොත් ඒ ගැන වග කියනු නොලැබේ.

20. මෙ පිළිබඳ වැඩි විස්තර ගොවිපල අධිකාරිගෙන් ලබා ගත හැක.

ජේ. යූ. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්ෂ, කෘෂිකර්ම ගොවිපල්.

1973.06.29 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කාර්‍යාලයේ දී ය (ගොවිපල්).

7-321—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුණ්ඩසාලේ පාසල් ගොවිපලේ වියළි කොකෝ ඇට විකිණීම

කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කායසීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කුණ්ඩසාලේ පාසැල් ගොවිපලේ පහත සඳහන් වියළි කොකෝ ඇට තොගය විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1973 ජුලි 27 වන දින පස්වරු 2 වනතෙක් භාරගනු ලැබේ.

| කොකෝ වර්ගය | විකිණීමට තිබෙන රාත්තල් ගණන |
|---|---|
| එෆ් 2 | 96 |
| එෆ් 3 | 69 |
| එෆ් 4 | 37 |
| බී.කේ. 3 | 244 |
| බී.කේ. 4 | 254 |

2. කුණ්ඩසාලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කායසීලයෙන් ලබාගන්නා ලද ෆෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා " කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදනය කායසීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති " නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි කුණ්ඩසාලේ පාසැල් ගොවිපලේ වියළි කොකෝ ඇට මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. 1973 ජුලි මස 25 වන දින දවල් 11 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ.

තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිණි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වේනොත්, එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර " කුණ්ඩසාලේ පාසැල් ගොවිපලේ වියළි කොකෝ ඇට මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් ද, ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද කවරයේ සඳහන් කොට " කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කායසීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන " වෙත ටෙන්ඩර්කරු විසින්ම හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනම, ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දන්වීමක් නොලැබුණි නම්, ඒ බව කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ; ගොවිපල් පාලනය හා නිෂ්පාදන කායසීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දන්විය යුතුයි.

5. කැමති නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කායසීලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුගේ නම, ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කොට සති තුනක් ගතවනතුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැළකිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබුවාවූද, දේවල මුළු ගණනින් සියයට පහක (5%) ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත්, පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිමවූ විට පමණි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

12. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ, ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේත්, කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

13. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්, මෙම කොන්ත්‍රාත්තුව යටතේවූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්තුකරු එකඟ විය යුතු අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකිතරම්දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්තුකරුවා යම්කිසි විදියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා " ලාංකික " යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු, අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චෙක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරුවෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කලාසේ සළකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දැක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධ වීමේත් බලය රජය සතු වන්නේය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛණයේ තනි තනිව හෝ ලේඛණයේ නම සඳහන් වෙනත් අයෙකුගේ නම සමඟ හෝ ඇතුළුව සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සළකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර කුණ්ඩසාලේ පාසැල් ගොවිපලේ කළමනාකරුගෙන් දැනගත හැකිය.

හේ. යූ. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්).

1973 ජූනි මස 28 වන දින,
පේරාදෙනියේ දීය.

7-325—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කරදියන්ආරු රජයේ ගොවිපලේ යොයම් කපා ඇද ගොඩ ගැසීම—
1973 යල් කන්නය

කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, කරදියන්ආරු රජයේ ගොවිපලේ 1973 යල් කන්නයේ ගොයම් කපා ඇද ගොඩ ගැසීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1973 අගෝස්තු 10 වන දින පස්වරු 2 වනතෙක් භාරගනු ලැබේ.

| ගොයම් කැපීම ආරම්භ කරන දිනය | වී වර්ගය | කැපීමට තිබෙන මුළුවපසරිය අක්කර | ගොයම් කපා අවසන් කළ දිනය |
|---|---|---|---|
| 1973.08.26 ... | බී. ජී. 34–8 ... | 8 ... | 1973.08.31 |
| 1973.09.01 ... | එම ... | 6 ... | 1973.09.03 |
| 1973.09.10 ... | එම ... | 11 ... | 1973.09.15 |
| 1973.08.30 ... | බී.ජී. 34–6 ... | 10 ... | 1973.09.04 |

2. කුණ්ඩසාලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයෙන් ලබාගන්නා ලද ෆෝරමවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා ''කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති'' නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි කරදියන්ආරු රජයේ ගොවිපලේ ගොයම් කපා ඇද ගොඩගැසීම සඳහා ටෙන්ඩර් කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝරම ලබාගත හැක. 1973 අගෝස්තු මස 09 වන දින දවල් 11 වනතෙක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ.

තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිණි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තු රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වේනොත්, එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර ''කරදියන්ආරු රජයේ ගොවිපලේ ගොයම් කපා ඇද ගොඩගැසීම'' යනුවෙන්ද, ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද කවරයේ සඳහන් කොට ''කුණ්ඩසාලේ, කෘෂිකර් දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන'' වෙත ටෙන්ඩර්කරු විසින්ම හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනම, ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණි නම්, ඒ බව කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදනය කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දැන්විය යුතුයි.

5. කැමති නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සළකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුගේ නම, ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කොට සති තුනක් ගතවනතුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැළකිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබුවාවූද, දේවල මුළු ගණනින් සියයට පහක (5%) ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත්, පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිමවූ විට පමණි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආඥාවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

12. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ, ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමෙන්, කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

13. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්, මෙම කොන්ත්‍රාත්තුව යටතේවූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකිතරම්දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විදියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගුවීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එලැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සළකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා ''ලාංකික'' යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු, අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පායයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධව ඔහුගේ පත පොත, චෙක්රෝල් පොත්, පෙරෙටවු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරුවෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල හැම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කලාසේ සළකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ රජය මඟින් තබා ඇති ලේඛණයේ තනි තනිව හෝ ලේඛණයේ නම් සඳහන් වෙනත් අයෙකු ගේ නම සමඟ හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමඟ හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව බාරදීම නුසුදුස්සෙකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

හේ. යූ. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්).

1973 ජූනි මස 29 වන දින,
පේරාදෙණියේදීය.

7–322—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

## වාරිමාර්ග විදුලි බල හා මහාමාර්ග අමාත්‍යාංශය

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවාව—නැගෙනහිර දිසාව

නැගෙනහිර දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් නැගෙනහිර පළාතේ පිහිටි ඉඟිනියාගල, අම්පාර, මහඔය, කල්මුන, උන්නිච්චෙ, චෙන්කලඩි, මඩකලපුව, මුතූර්, කන්තලේ, ගොමරන්කඩවල සහ ත්‍රිකුණාමලය යන එක් එක් විධායක ඉංජිනේරු කොට්ඨාශ වෙනුවෙන් ප්‍රමාණ රථවාහන ද, පස් වැඩ කරන යන්ත්‍රද කුලියට ගැනීම සඳහා 1973 ජූලි මස 28 වෙනි දින පෙරවරු 10 දක්වා ලාංකිකයන්ගෙන් සහ ලාංකික ආයතනවලින් වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මඩකලපුව නැගෙනහිර දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ලබා ගත හැකි ආකෘති පත්‍රවල එක් එක් කොට්ඨාශය වෙනුවෙන් දෙපිට පතකින් යුතුව ටෙන්ඩර් තැන්පත් කළ යුතුය. එක් එක් කොට්ඨාශය වෙනුවෙන් රු. 25ක් බැගින් ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1973 ජූලි මස 26 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්, විශේෂ විස්තර හා කොන්දේසිවල පිටපත් නිකුත් කරනු ලැබේ. විශේෂ විස්තර හා කොන්දේසිවල පිටපත් සඳහා අමතරව රු. 2ක් ගෙවිය යුතුය.

3. ටෙන්ඩර් තැන්පත් මුදල් ඕනෑම කච්චේරියක හෝ මඩකලපුව දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ තැබිය හැකිය.

එන්. ජී. නාමෝදරම්,
දිසා වැඩ අධ්‍යක්ෂ, නැගෙනහිර දිසාව.

දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
නැගෙනහිර දිසාව, මඩකලපුව.
1973 ජූලි මස 26 දින දී ය.

7-416—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පදවියෙහි ජනපදික නිවාස තැනීම සඳහා ටෙන්ඩර්

ඉහත සඳහන් ජනපදයෙහි මතු දැක්වෙන නිවාස තැනීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1973 අගෝස්තු මස 03 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**ජනපදික නිවාස 100**

මැටි බදාමින් සහ පිළිස්සූ ගඩොලින් බැඳීම

2. 1973.08.02 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක, අනුපිටපතකුත් සමග, ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 250 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. රිසිට් පත්, තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පදවියෙහි ජනපදික නිවාස තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේ ය.

7. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට හය (6) මසක් ඇතුළත වැඩය නිමකළ යුතුය.

8. සාර්ථකවූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දැන් වූ කල්හි, පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1973.08.03 දින පෙරවරු 11.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ අඩුම වශයෙන් රු. 50,000 කට රෙජිස්ටර් වූවන් විය යුතු අතර ටෙන්ඩර් පත් ලබා ගැනීමේදී එම රෙජිස්ටර් වීම ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාර ගැනීමේ බලය රජය සතුවේ.

13. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 1973.06.30.
සිපී/1/482

7-336—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහකනදරාවෙහි ජනපදික නිවාස තැනීම සඳහා ටෙන්ඩර්

ඉහත සඳහන් ජනපදයෙහි මතු දැක්වෙන නිවාස තැනීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1973 අගෝස්තු මස 03 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**ජනපදික නිවාස 100**

මැටි බදාමින් සහ පිළිස්සූ ගඩොලින් බැඳීම

2. 1973.08.02 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක, අනුපිටපතකුත් සමග, ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 250 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. රිසිට් පත්, තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මහකනදරාවෙහි ජනපදික නිවාස තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේ ය.

7. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට හය (6) මසක් ඇතුළත වැඩය නිමකළ යුතුය.

8. සාර්ථකවූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දැන් වූ කල්හි, පොරොන්දු පත්‍රය අත්සන්

කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1973.08.03 දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ අඩුම වශයෙන් රු. 50,000 කට රෙජිස්ටර් වූවන් විය යුතු අතර ටෙන්ඩර් පත් ලබා ගැනීමේදී එම රෙජිස්ටර් වීම ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් බාර ගැනීමේ බලය රජය සතුවේ.

13. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සිපි/1/481
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 1973.06.30.

7– 333—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### විදුලියෙන් ක්‍රියාකරවන වතුර පොම්පයක් සැපයීම

විනාඩියකට ගැලුම් 15 ක ධාරිතාවයක් ඇති විදුලියෙන් ක්‍රියාකරවන වතුර පොම්පයක් සැපයීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 73.07.27 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර්කරු විසින් සැපයීම කළ යුත්තේ තිබෙන තොගයෙන් කිරුළපනයේ මධ්‍යම ගබඩාවට භාරදීමටත් ය. ටෙන්ඩර්කරුවන් විසින් භාරදිය හැකි ඉතාම නුදුරු කාලසීමාව සඳහන් කළ යුතුය.

3. 73.07.27 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝරමයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් විදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පෝරම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකිවූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. සියලු ටෙන්ඩර් කවරයන් හි වම් පස ඉහළ කෙළවරේ "විදුලියෙන් ක්‍රියා කරවන වතුර පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන්, පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීතැනට භාරදිය යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම. කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

7. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුලත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 73.07.27 වැනි දින පෙරවරු 11.00ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සිපි/2/428
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 1973 ජූනි 30.

7–335—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පදවිය ව්‍යාපාරයේ කැළෑ යන්ත්‍රානුසාරයෙන් එළිකිරීම

මුල් ගැලවීම, කාණු වෙන්කිරීම, මුල් පිලිස්සීම, සමතලා කිරීම අනවශ්‍ය ද අස් කිරීම හා නියර දැමීම ඇතුළුව පහත සඳහන් ප්‍රදේශයන් හි යන්ත්‍රානු සාරයෙන් කැළෑ එළිකිරීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1973. 07. 27 වැනි දින පෙරවරු 11.00 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| දිස්ත්‍රික්කය | ව්‍යාපාරය | ආසන්නතම වපසරිය අක්කර |
|---|---|---|
| අනුරාධපුරය ... | පදවිය ... | 946 |

2. දිස්ත්‍රික්කයන් හි දිසාපති කාර්යාලයේ මානක නිලධාරි තැන හෝ දිසාපතිගේ නියෝජිතයෙකු විසින් එළිකළ යුතු කොටස්වල මායිම් පෙන්වන අතර එම මායිම් නොඉක්ම විය යුතුයි. බිම් කොටස් වල මායිම් සැලැස්මේ හා භූමියෙහි දැක්වීමෙන් පසුව එයින් පිටස්තර වශයෙන් කිසිවක් නොකළ යුතු අතර ගෙවීම් කරනු ලබන්නේ මායිම් තුල කළ වැඩට පමණකි.

3. මෙම කාර්යාලයට හෝ ලංකා බැංකුවේ (යෝක් වීදිය කාර්යාලයේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂකගේ ගිණුමට හෝ කොළඹින් පිටත, දිසාපති කාර්යාලයට හෝ රු. 200ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කොළඹ 1, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂකගෙන් 1973. 07. 26 වැනි දින දවල් 12 වන තෙක් ලබාගත හැකි ආකෘතිවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් බහාලු ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පදවිය ව්‍යාපාරයෙහි යන්ත්‍රානුසාරයෙන් කැළෑ එළි කිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට කොළඹ 1, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ලියුම් කවරයේ වම් පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියා පදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ යුතුයි.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් භාරගෙන අවසන් වූ දින සිට දින 30 ක් යන තෙක් ඒවා ආපසු නොගත යුතුය.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට තෙමසක් ඇතුළත වැඩය නිම කළ යුතුය.

7. ඇපයක් ඉදිරිපත් කොට පොරොන්දු පත්‍රය අත්සන් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට සාර්ථක වූ ටෙන්ඩර්කරු අසමත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වීමටද හේතු වන්නේ ය. එවැන්නන්ට රජයේ කොන්ත්‍රාත් දෙනු නොලැබේ.

8. කොළඹ 1, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1973. 07. 27 වැනි දින පෙරවරු 11.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේ දී පෙනී සිටිය හැක.

9. තෝරා ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් විසින් අත්සන් කළ යුතු ගිවිසුම් පත් ආකෘති ප්‍රදේශයේ දිසාපතිගෙන් ලබාගෙන පරීක්ෂාකාරීව කියවා බලා, යම්කිසි කරුණක් පැහැදිලි කරවා ගැනීමට අවශ්‍ය වුවහොත් දිසාපති කාර්යාලයෙන් එය පැහැදිලි කරවා ගත යුතුයි.

10. යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂේප කිරීම සහ ටෙන්ඩරයක යම්කිසි කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුවන අතර ඒ ගැන ප්‍රශ්න කළ නොහැක.

11. ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් අදාල දිස්ත්‍රික්කයේ දිසාපති සමග කොන්ත්‍රාත්තුවක් අත්සන් කළ යුතුයි.

12. විධිමත් පරිදි බලය නොලබා කොන්ත්‍රාත්තුවක් වෙනත් කෙනෙකුට පැවරීම හෝ බදුදීම නොකළ යුතුයි. කොන්ත්‍රාත්කරු විසින් ඔහු වෙනුවට කොන්ත්‍රාත්තුව කරගෙන යාම වෙනත් කෙනෙකුට බලය පවරමින් නිකුත් කරන ලද ඇටෝනි බලයක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රජය සතුවේ.

13. යම්කිසි හේතුවක් නිසා කොන්ත්‍රාත්කරු විසින් සේවයේ නොයෙදවිය යුතු පුද්ගලයකු සිටී නම් දිසාපති විසින් ඒ ගැන කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව දැන්විය යුතු අතර කොන්ත්‍රාත්කරු විසින් එබඳු පුද්ගලයකු සේවයේ නොයෙදවිය යුතුයි.

14. රජයේ කොන්ත්‍රාත්තුවක් මීට පෙර කර නැති ටෙන්ඩර්කරුවෙකු විසින් ටෙන්ඩර් ආකෘති ඉල්ලුම් කරන විට තමාගේ සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය සහ තමන්ට අයත් ඉඩකඩම් හෝ වෙනත් දේපල තිබෙන දිස්ත්‍රික්කය හෝ දිස්ත්‍රික්ක සඳහන් ලිඛිත ප්‍රකාශයක් ආකෘති නිකුත් කරන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉඩකඩම් වල වපසරිය සහ වෙනත් දේපලවල ස්වභාවය හා ප්‍රමාණය සඳහන් කළ යුතුයි. වෙනත් දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත් කර ඇති ටෙන්ඩර්කරුවකු විසින් එම දෙපාර්තමේන්තුවේ නම සහ වැඩය කළ දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුයි.

15. ටෙන්ඩර් කරුවන් විසින් තැන්පත් මුදල් සඳහා ලබාගත් කුවිතාන්සි සුරක්ෂිතව තබාගෙන එම මුදල් ආපසු ඉල්ලන විට එකී කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි. එම කුවිතාන්සි ටෙන්ඩර්වලට නොඇමිණිය යුතුයි.

16. ටෙන්ඩර් ආකෘති ආදිය ලබාගැනීමෙන් පසුව ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයගේ තැන්පත් මුදල් ආපසු ගෙවීම කරනු ලබන්නේ ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය සහ නියමිත වේලාවට පෙර ඔවුන් විසින් ආකෘති ආපසු එව්වොත් පමණකි.

17. වැඩි විස්තර ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂගෙන් ලබාගත හැක.

යූ. ඒ. ගුණරත්න,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

සිටී/1/479
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇවිලන් චතුරශ්‍රය,
කොළඹ 1.
1973 ජූනි 30 වන දින.

7-334--73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

**හම්බන්තොට කච්චේරිය**

**හම්බන්තොට දිස්ත්‍රික්කයේ මෙහි පහත දක්වෙන තැනීම් වැඩ සඳහා 1973. 08. 03 වැනි දින පස්වරු 2 දක්වා කොළඹ තැපැල්** පෙට්ටිය අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් **මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.**

| **වැඩයේ නම** | **ලියාපදිංචි වියයුතු මුදල රු. ශත** |
| --- | --- |
| 1. මැදකන්ද-හිඟුරකන්ද-අලුපොත **දෙණිය පාරේ පළමු සැතැපුම්** භාගය තැනවීම. | |

2. ඉහත සඳහන් කර ඇති වැඩට ඉදිරියෙන් දක්වා ඇති මුදල් ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට කොන්ත්‍රාත්කරුවන් වශයෙන් **රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට හා අනුමත කරන ලද සංගම්වලටද, 1973.07.28 දින පෙරවරු** 11 දක්වා හම්බන්තොට දිසාපති විසින් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ලියාපදිංචිය හා අතිකුත් ද සනාථ කිරීම සඳහා ලිය කියවිලි ඉදිරිපත් කල යුතුයි.

**3. ටෙන්ඩර් ෆෝර්ම අපේක්ෂකයින් විසින් හම්බන්තොට කච්චේරියේ** ඉහත සඳහන් වැඩය වෙනුවෙන් රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගන්නා ලද කුවිතාන්සියක් හම්බන්තොට දිසාපති වෙත ඉදිරිපත් කල විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. චෙක්පත්, **මුදල් ඇණවුම් හා තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. අනුමත** කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර **සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයත් සමිති වලටද, එම වැඩ සඳහා ඉහත දක්වෙන මුදල් ප්‍රමාණයන්ට හෝ ඊට** වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී තිබේ **නම් එකී වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කල හැකියි. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරන ලද සමිති නිදහස් කරනු ලැබේ. එහෙත් ඉහත එක් එක් වැඩය වෙනුවෙන් දක්වෙන මුදල්** ප්‍රමාණයට ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු **පමණක් එකී සමිතිවලට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.**

4. ටෙන්ඩර් ෆෝර්ම සම්පූර්ණ කොට පිටපත් දෙකකින් යුක්තව ලේඛණ ගත තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම් ඉහළ කෙළවරේ වැඩෙහි නම ලියා තැබිය යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම තැපැලෙන් නොඑවන්නේ **නම් ගාලුමුවදොර, මහලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කල යුතුයි.**

**5. 1973 අගෝස්තු මස 3** වන දින පස්වරු **2.30** ට ඉහත කී අංක 320 දරණ කාමරයේදී ටෙන්ඩර් ෆෝර්ම විවෘත කරනු ලැබේ.

**6. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලියවිල්ලකින් දන්වූ පසු දින 10 ක් ඇතුලත ගිවිසුම් පත්‍ර අත්සන් කිරීමට හා ඇප මුදල් තැබීමට අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර්** ෆෝර්ම ලබා ගැනීම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක **කරනු ලැබේ.**

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරය මුළු මුදලින් සියයට 5 ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි. එසේම ටෙන්ඩරුකරුට ටෙන්ඩර්ය පිළිගත් බව දැනුම් දීමෙන් දින 7 ක් ඇතුලත දී වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට සූදනම්වසිටිය යුතුය. ටෙන්ඩර් භාරගත් බව සඳහන් ලියවිලි ඔහුට පුද්ගලිකව භාරදීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ ඔහුට ඒ බව දන්වූ බව පිළිගැනෙනවා ඇත. එසේ දැනුම් දීමෙන් පසු ගිවිසුම් පත්‍ර අත්සන් තැබීම අතපසු කළ හොත් හෝ තැන්පත් ප්‍රතික්ෂේප කළහොත් මුදල රාජසන්තකවනවා ඇත. අසාර්ථක ටෙන්ඩරකරු වන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවීමට කටයුතු කරන්නේ පිළිගත් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුදලින් සියයට 5 ක මුදල් ඇප වශයෙන් තැන්පත් කළ පසුය.

8. මෙම කොන්ත්‍රාත් කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතු අතර, එවැනි කම්කරුවන් හැකිතාක් බඳවාගත යුත්තේ වැඩය කරන ප්‍රදේශයේ සිටින අය අතුරිනි. කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දනට බලපවත්නා හා මින්පසු ක්‍රියාත්මක විය හැකි රෙගුලාසිවලට අනුකූල වූ වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

9. වැඩි විස්තර පුත්තලම් දිසාපති වෙතින් ලබාගත හැකිය.

බ. සු. විජේවීර,
පුත්තලම දිසාපති,

7–252/1—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

### පුත්තලම දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

පුත්තලම දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ හඳහා 73.08.03 දින පස්වර 2.30 දක්වා කොළඹ, තැ.පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය කොළඹ, ගාලු මුවදෙර, මහ ලේකම් කාර්යාලයේ තුන්වැනි මහලේ පිහිටි ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 320 දරන කාමරයේ තබනු ඇත :—

| | වැඩයේ ස්වාභාවය | | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | | ලියාපදිංචි විය යුතු මුදල රු. |
|---|---|---|---|---|---|
| 1. | කවකාර තෝට්ටම් පාර | ... | පුත්තලම | ... | 30,000 |
| 2. | කීලමඩු වේනයි පාර | ... | පුත්තලම | ... | 30,000 |

2. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට ද, රජයේ දෙපාර්තමේන්තුවල ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් දක්වා ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ටද 73.08.01. දින පෙ.ව. 10.00 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් පුත්තලම කච්චේරියෙන් හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ කොළඹ මහ භාණ්ඩාගාරයට හෝ ඉහත සඳහන් ඇති වැඩවලට, එක් එක් වැඩය වෙනුවෙන් රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් හා ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් මුදලකට ලියාපදිංචි වී ඇති බවට සාධකයන් පුත්තලම දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. අනුමත කරන ලද සමිති ටෙන්ඩර් තැන්පත් මුදලින් නිදහස්ය. එහෙත් ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ පුත්තලම දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ " ........... සඳහා ටෙන්ඩර් පත්‍රය " යයි සඳහන් කළ යුතුය. සියළුම ටෙන්ඩර් අත්සන් තබා සීල්කර සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ලේඛනගත තැපැලෙන් නොඑවන්නේ නම්, කොළඹ, ගාලු මුවදෙර පිහිටි මහාලේකම් කාර්යාලයයේ තුන්වැනි මහලේ පිහිටි ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ පැමිණ බහාලිය යුතුය.

5. 73.08.06. දින පෙ.ව. 10 ට ඉහතකී අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අතර එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට පැමිණී සිටය හැක.

6. කිසිදු හේතුවක් නොදක්වා සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් පිළි ගැනීම හෝ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුලු මුදලින් සියයට පහක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුය. එසේම ටෙන්ඩර්කරුට ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දීමෙන් දින 7 (හත)ක් ඇතුළතදී වැඩ ගිවිසුමකට අත්සන් කිරීමට ඔහු සූදනම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාරගත් බව සඳහන් ලියවිලි ඔහුට පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යැවීමෙන් ඔහුට ඒ බැව් දන්වූ බව පිළිගැනෙනවා ඇත. එසේ දැනුම් දීමෙන් පසු ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීම අතපසු කළහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවා ඇත. අසාර්තක ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවීමට කටයුතු කරන්නේ පිළිගත් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුදලින් සියයට පහක තැන්පත් ඇප මුදලක් වශයෙන් තැන්පත් කළ පසුවයි.

8. මෙම කොන්ත්‍රාත්තුව කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යොදවා ගැනීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතු අතර එවැනි කම්කරුවන් හැකිතාක් බඳවා ගත යුත්තේ වැඩය කරන ප්‍රදේශය තුලිනි. කම්කරුවන්ට වේතනය ගෙවීම සම්බන්ධයෙන් දැනට බලවත්වන හා මින් ඉදිරියට ක්‍රියාත්මක වියහැකි සියලුම රෙගුලාසිවලට අනුකූලව වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතුය.

9. වැඩි විස්තර පුත්තලම දිසාපති වෙතින් ලබා ගත හැක.

බ. සු. විජේවීර,
පුත්තලමදිසාපති.

7—252/2-–73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම්

### කැලෑ දෙපාර්තමේන්තුව
### දැව වෙන්දේසියේ විකිණීම

අම්පාර අඩවියේ, විශේෂ වන පාලක කාර්යාල භූමියේ ඇති වන අපරාධවල අත් අඩංගුවට ගත් බුරුත්ත, වැවරන, ඇටඹිලිපි යනාදී වර්ගයෙන් දැව තොග සඟ කරන්න නැගෙනහිර දිසා වන නිලධාරි විසින් අම්පාර විශේෂ වනපාලක කාර්යාලයේ දී, 1973.07.30 වැනි දින 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන් දැව වෙන්දේසි කිරීමට පෙර එම ස්ථානයේ ඇති දැව පරීක්ෂාකර බලා තැබීමකට පත් විය යුතුයි.

වැඩි විස්තර සඳහා අම්පාර විශේෂ වන පාලක ගෙන් විමසන්න.

ඩබ්. ජේ. ජේ. මේදර්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරී.

1973.06.21 දින,
මඩකලපුව,
දිසා වන කාර්යාලයේ දී ය.

7-414 —73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

### රේගු වෙන්දේසියක්

පහත සඳහන් බඩු 1973 ජූලි මස 24 වැනි දින පෙ. ව. 9.30 ට එෆ් 2 විකිණීම් ගුදමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම බඩු ගනු කැමැත්තන් විසින් ඒවා 1973 ජූලි මස 23 වැනි දින පෙ. ව. 10 සිට ප. ව. 3 දක්වා පරීක්ෂා කළ හැක.

බඩු මිළට ගත් වහාම එයි වටිනාකමින් සියයට 50 ක අත්තිකාරම් මුදලක් මිලදී ගත් අය විසින් ගෙවිය යුතුය.

මෙම විකිණීමට අදාල වෙනත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වෙනි දින රජයේ ගැසට් පත්‍රය බලනු මැනවි.

ඩී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : පීඕ/විකිණීම්/38/73,
1973.06.27 වැනි දින.
කොළඹ, ශ්‍රී ලංකා රේගුවේ,
නිවාරණ කාර්යාලයේ දීය.

1. යකඩ කම්බි දැල් රෝල් 10 යි
   තඹ කම්බි දැල් රෝල් 18 යි
2. ෂේවිං සෙට් 1 යි.
3. වේවැල් කූඩයක දැමූ නයිලෝන් සාරි (2) ක් (කිලිටිවූ— තරක් වී ඇත) සහ කැට්ට රෙදි යාර 1 යි.
4. නයිලෝන් ඉතුවිං සාර 17 යි, නයිලෝන් සාරි 1 යි.
5. නයිලෝන් සාරි 2 යි (පලුදු වූ).
6. ටෙට්රෝන් කමිස රෙදි යාර 2½ යි.
7. 5/32—වානේ බෝල පින් 3 යි. 3/16 වානේ බෝල පින් 2 යි.
8. " එරෝපොට්ඩා " රාත්තල් 1½ යි.
9. නවන කුඩ 1 යි. ' එක්ස්පෝ 70 ' ඒ.ඊ.සී. පොකට් රේඩියෝ 1 යි. ගිනි පෙට්ටි පැකට් 1 යි.
10. " ආයවා " පොකට් ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1 යි (කේ. 0619).
11. " බයරෝ " කාබන් කූරු 56 යි.
12. සිගරට් දවටන (කඩදාසි) පැකට් 80 යි.
13. (1) 5/32 ප්‍රමාණයේ වානේ බෝල පින් 30 යි.
    (2) 3/16 ප්‍රමාණයේ වානේ බෝල පින් 20 යි.
    (3) 1/8 ප්‍රමාණයේ වානේ බෝල පින් 24 යි.
    (4) සබ් ෂෙල් 16 යි.
    (5) පාපැදිවල බ්‍රේක් කූරු 44 යි.
    (6) ඩස්ට් කැප් (ද්‍රවිලි ආවරණ පියන්) 400 යි.
    (7) වැල් සමග (ද්‍රවිලි ආවරණ පියන්) 96 යි.
    (8) වැල්ව් නට්ස් කෑලි 280 යි.
14. (1) ටයිගර් වර්ගයේ බියර් කේස් 3 යි.
    (2) ' පිලිප්ස් ' සී 60 ප්‍රමාණයේ කැසට් 1 යි.
    (3) ' ටී ' ෂර්ට් 3 යි.
    (4) ප්ලාස්ටික් සෙල්ලම් බඩු 1 යි.
    (5) (ප්ලාස්ටික් බෑගයක දමනු ලැබූ)
15. කුණු ගැවුනු කලිසම් රෙදිකෑලි 1 යි.
16. වික් මීට් 1 යි (බෙලෙක් පතුරු).

17. සිගරැට් දවටන පැකට් 30 යි.
18. සිගරැට් දවටන පැකට් 12 යි.
19. (1) 15 ප්‍රමාණයේ ඇලන්ස්කොට් කමිස 13 යි.
(2) 16 ප්‍රමාණයේ ඇලන්ස්කොට් කමිස 16 යි.
(3) 15½ ප්‍රමාණයේ ඇලන්ස්කොට් කමිස 20 යි.
(4) සිල්ව ස්ටාර් වර්ගයේ ප්ලාස්ටික් රෝල් 75 යි.
20. (1) මුද්‍රිත පැබ්‍රික් රෝල් 18 යි.
(2) මුද්‍රිත පැබ්‍රික් රෝල් 1 යි.
(3) සුදු පොප්ලින් රෝල් 1 යි.
(4) පිජාමා රෝල් 1 යි.

කිලිටි වී ඇත.

21. කපු වොයිල් සාරි 1 යි (කිලිටිවූ).
22. ටෙරලීන් කමිස රෙදි යාර 5 යි (කිලිටිවූ).
23. නයිලෝන් කමිස රෙදි යාර 7½ (කිලිටිවූ).
24. හිස් බෝතල් 128 යි.
25. පාවිච්චි කරන ලද කමිස 1 යි.
26. ඉබි යතුරු 8 යි (මලබැඳී ඇත).
27. සිල්ක් සාරි 2 යි (පලුදුවූ).
28. හිස් පැලඳුම් (හෙඩ් ටයිස්) 2 යි.
29. බතික් කමිස 7 යි.
30. (1) බෝල්ට්ස් 26 යි.
(2) රබර් පෑඩ් 1 යි.
31. කාර් විදුලි බුබුලු 12 යි.
32. ලී පෙට්ටියක බහාලූ "මාලිමා යන්ත්‍ර" 1 යි. (නො. බී. 5047).
33. වළලු කූට්ටම් (බැංගල්ස්) 7000 යි.
34. පාපැදි සඳහා වූ දම්වැල් 60 යි. පාපැදි ෆ්‍රීවීල් (දැති රෝද) 48 යි.
35. "හයිපොඩමික්" ඉඳිකටු පෙට්ටි 6 යි. (එක් පෙට්ටියක 12 බැගින් වේ).
36. මෙටලික් රැහැන් රෝද 15 යි.
37. (1) ලේස් රෝල් 16 යි.
(2) ගැහැණු දැති පනා 24 යි.
(3) ක්‍රෙස්ට් පෙල්ට් පෑන් 12 යි.
(4) ගෝ-ගෝ වර්ගයේ හිස පළඳන දැල් 1 යි (කාඩ් එකක 12 ක් ඇත).
(5) අනුකරන දම්වැල් පැ. 1 යි (රන්වන් පාට වේන්).
(6) අනුකරන දම්වැල් පැ. 1 යි (රිදී පාට චේන්).
(7) 'සීකෝ' වානේ ඔර්ලෝසු පටි 24 යි.
(8) 'සීකෝ' වානේ ඔර්ලෝසු පටි 12 යි.
(9) නූල් පොදි 12 ක් අඩංගු පාර්සල් 2 යි.
(10) හිස් පළඳනා පැකට් 1 යි.
38. (1) ගෝ-ගෝ වර්ගයේ කොන්ඩා දැල් පැ. 11 × 12 යි.
(2)
(3) බඳ පටි 1 යි.
(4) කමිස අත් බොත්තන් ජෝඩු 5 යි (කෆ්ලිංස්).
(5) හරනල් කටු කාඩ් 48×12 යි.
(6) හරනල් කටු කාඩ් 7 × 11 යි.
(7) ඇපලෝ වර්ගයේ 650 යි.
(8) රවුම් පනා 8 යි.
(9) අරුංගල් ජෝඩු 12 අඩංගු කාඩ් 17 යි.
(10) කොන්ඩා කටු කාඩ් 34 × 12 යි.
(11) අරුංගල් ජෝඩු 12 හේ කාඩ් 15 යි.
(12) හිසේ පළඳින ආභරන කාඩ් 23 × 12 යි.
39. ඇඳ ඇතිරිලි 5 යි; යාර 14 × 2 වේට්ටි.
40. කරාබු නැටි රා. 36 අඩංගු මළු 1 යි. රාත්තල් 5 යි.
41. 750 × 16 ටියුබ් 1 යි.
42. කිලිටිවූ රෙදි කෑලි 19 යි; කපු බ්ලැන්කට්ටු 1 යි.
43. ගැල්වනයිස් ෂීට් 1 යි (නරක්වූ).
44. (1) බ්‍රෂ් සිලින්ඩර් ලොක් 1 යි.
(2) සුදු ලෝපා ලොක් 1 යි.
(3) ස්පඩෝ වීල් 1 යි.
(4) බෝල් රේසර් 1 යි.
(5) බෙයාරිං සෙට් 4 යි.
(6) බෙයාරිං කෑලි 1 යි.
(7) ඇඞ්සස් 3 යි.
(8) නියං 8 යි.
(9) ඊයම් කෑලි 2 (රා. 22).
(10) ලින්ට් කෑලි 3 යි.
(11) වානේ කෑලි 2 යි.
45. ගෝනි 6 යි.
46. සිගරැට් දවටන 790 යි.
47. ප්ලාස්ටික් වළලු ජෝඩු 48 රෝල් 290.
48. ඉන්ටසෙප්න්ස් 5 යි; ප්ලාස්ටික් බෝල 5 යි; සනීපාරක්ෂක උපකරණ කෑලි 10 යි.
49. ඩිස්ට් ටින් 15 යි; විටමින් 'ඊ' පෙති 1000 බැගින් අඩංගු ටින් 2 යි; බෙරේක් ඔයිල් ටින් 2 යි; ජැක් 1 යි; ජැක් 1 යි (රෝදය සහ ලීවරය සමග); පැති කණ්නාඩි 1 යි.
50. ජර්සි 1 යි.
51. ජර්සි 1 යි.
52. ෆේස් ඊඩ් රෙගියුලේටර් 1 යි.
53. බෝල් රේසර් 1 යි.
54. පාට ටින් (පේන්ට්) 1 යි.
55. සනීපාරක්ෂක උපකරණ පොදි 1 යි.
56. මෝටර් රථ කොටස් පොදි 1 යි.
57. නයිලෝන් රැහැන් පොදි 1 යි.
58. කේබල් 1 යි.
59. නො. 371 දරණ පයිබ ග්ලාස් බෝට්ටු 1 යි; පැට්‍රෝල් ටැන්කි දෙකක් සමග පිට මෝටරයක් (අවුට්බෝඩ් මෝටරයක්): පාවෙන ලී කොටය සමග නයිලෝන් කඹය.
60. බීඩි කොල රාත්. 18 යි.
61. බීඩි කොල රාත්. 2 යි; බීඩි කොල රාත්. 4 යි.
62. කාබන් බුරුසු 18 යි.
63. විනිවිද පෙනෙන සාරි 4 යි (නරක්වූ).
64. වැඩ දමන ලද නයිලෝන් සාරි 4 යි (කිලිටිවූ).
65. පළුදුවූ කපු සාරි 3 යි.
66. (1) සිල්ක් සාරි 3 යි (පළුදුවූ).
(2) පබලු දම්වැල් 8 යි.
(3) පබලු වළලු ජෝඩු 1 යි.
(4) කැටයම්කල සෙල්ලම්බඩු කෑලි 16 යි.
(5) රිබන් පටි රෝල් 2 යි.
(6) ලී සෙල්ලම් බඩු පෙට්ටි 1 යි.
(7) කපු සරොන් 1 යි.

සියල්ලම බඩු බහාලූ කූඩයකි.

67. යාර 42 බැගින් වූ මුද්‍රිත කමිස රෙදි රෝල් 8 යි (පලුදුව කිලිටිව ඇත).
68. රෙදි රෝල් 2 යි (පළුදුව ඇත).
69. දුම්මල මළු 1 යි (ගම් ඇරබික්).
70. ඉන්දියන් කජු රා. 30 ක ටින් 1 ක්, හිස් ටින් එකක් (1).
71. රාත්තල් 20 බීඩි කොල මළු 1ක්.
72. හිස් ගෝනි 71 යි.
73. ට්‍රැක්ටර් අමතර කොටස් 1 යි
74. වොයිල් සාරි 2 යි (නරක්වූ).
75. (1) අනුකරන ආභරන.
(2) ගෝ-ගෝ හිසේ දමන දැල් 30 × 12 ක්,
(3) කොන්ඩකටු 84 ක්,
(4) සෙල්ලම් ඔර්ලෝසු 160 ක්,
(5) ඇඟි බඹවල ගාන පැන්සල් 50 ක්,
(6) තෝඩු 76 ක්,
(7) 'ෂී සෙල්' බෙල්ලේ දමන මාල 70 ක්,
(8) පබළු මාල 6 ක්,
(9) අනුකරන මාල ද්‍. 4 ක්,
(10) 'එවරෙඩි' ටෝච් බල්බ් පැ. 25 × 10.
(11) ප්ලෑෂ් බල්බ් 50 ක් (එවරෙඩි),
(12) කළු සහ සුදු පබලු රා. 2 යි.
76. ප්ලාස්ටික් දම්වැල් 12 ක්.
77. බයිසිකල් දම්වැල් 57 ක්, අයිටෙක්ස් පැකට් 263 යි.
78. (1) පැට්‍රොමැක්ස් කොටස් කෑලි 142 යි.
(2) ග්‍රෝස් 1 බැගින් වූ ඉඳිකටු පැකට් 20 යි.
(3) නිපල්ස් 550 යි.
(4) කාබනෙන්ඩම් කෑලි 58 යි.
79. (1) කාබනෙන්ඩම් කෑලි 780 යි.
(2) ගෑස් චෙම්බර් කෑලි 138 යි.
(3) ඉඳිකටු ග්‍රෝස් 1 පැකට් 4 යි.
(4) නිපල් 875 යි.
80. කාබන්ඩම් කෑලි 1320 යි.
81. (1) ලාම්පු උඩ කොටස් කෑලි 30 යි.
(2) කෑලි 72 බැගින් වූ නිපල් පැකට් 19 යි.
(3) කෑලි 60 බැගින් වූ නිපල් පැකට් 1 යි.
(4) කළු රැන් කැරලි පැකට් 39 × 12 යි.
(5) කළු රැන් කැරලි පැකට් 4 × 10 (රන්වන් ඉර සහිත).
(6) රතු රැන් කැරලි පැකැට් 39 යි (රන්වන් ඉර සහිත).
(7) ක්‍රොචට් බෝවලස් 36×12.
82. ඉඳිකටු ග්‍රෝස් එකේ පැකට් 28 යි (576).
83. කාබනන්දම් කෑලි 1380 යි.
84. කුඩා ඉබි යතුරු 330 යි (මලකඩ බැඳුන).
85. පැට්‍රෝමැක්ස් වේපර්ස් 252 යි.
86. පැට්‍රොමැක්ස් නිපල් 2276 යි.
87. මාළු 6 යි.
88. සුදු සහ කළු පබලු රාත්තල් 20 යි.
89. අංක ටීටීඑන්. 149 දරණ රුවල් බෝට්ටුවක්—ඇතුළත එන්ජිම සවිකර ඇති මාළු මරන බෝට්ටුවක්.
90. අත්සන් කිරීම සඳහා ගන්නා ලද පවුන්ටන් පෑන්තල පැකට් 70 × 144.
91. කැල්පොන් බෝතල් 1 ක්.
සිග්සැක් සිගරැට් කොල පැකට් 65 ක්.
ගුලා තලව් (බෝල් රේසර්) 4 ක්.
92. ආරක්ෂික රේසර් සෙට් 22 ක්.

7-275—73.07.13 දින අංක 68 දරන ගැසට් පත්‍රය

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

මෙහි පහත සඳහන් රාජසන්තක කරන ලද හා මෙතෙක් අයිතිකරුවන් ඉදිරිපත්වී නොමැති භාණ්ඩ 1973.7.25 වැනි දින පෙ.ව. 9.00 ට බලපිටියේ මහේස්ත්‍රාත් උසාවියේදී ප්‍රාදේශීය උසාවි පාලන ලේකම් ඉදිරිපිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මහජනයාට මෙයින් දැනුම් දෙනු ලැබේ.

බඩු මිලදී ගන්නන් විසින් ඒ වේලේම මුදල් ගෙවා බඩු ඉවත් කර ගත යුතුය.

මහේස්ත්‍රාත් බලපිටිය.

1973.6.28
බලපිටිය මහේස්ත්‍රාත් උසාවියේදී ය.

| නඩු අංකය | | භාණ්ඩය | |
|---|---|---|---|
| 69807 | ... | හිස් අරක්කු බෝතල | 1 යි |
| 11349බී/ඊ | ... | එම | 2 යි |
| 70706 | ... | එම | 1 යි |
| 11470බී/ඊ | ... | එම | 3 යි |
| 70724 | ... | එම | 1 යි |
| 70873 | ... | එම | 1 යි |
| 10965බී/ඊ | ... | එම | 1 යි |
| 70472 | ... | එම | 1 යි |
| 70700 | ... | එම | 1 යි |
| 70704 | ... | එම | 1 යි |
| 64180 | ... | බැරල් | 4 යි |
| | | රබර් කෑන් | 1 යි |
| | | බෝතල | 1 යි |
| | | ජාර් | 1 යි |
| 69421 | ... | හිස් අරක්කු බෝතල් | 2 යි |
| 11342බී/ඊ | ... | පැන්සල් | 6 යි |
| 70978 | ... | රබර් කෑන් | 1 යි |
| | | හිස් අරක්කු බෝතල | 1 යි |
| 70305 | ... | රබර් කෑන් | 1 යි |
| | | හිස් අරක්කු බෝතල | 1 යි |
| 71293 | ... | ප්ලාස්ටික් කෑන් | 1 යි |
| | | බෝතල | 1 යි |
| 71422 | ... | ලී බාල්දි | 1 යි |
| ඒ 773/72 | ... | ටයිම්පීස් ඔර්ලෝසු | 1 යි |
| | | කුඩ | 1 යි |
| 69478 | ... | හැලුම් 4 ටින් | 1 යි |
| 70067 | ... | ගෝනි | 5 යි |
| අංකයන් නො. මැති | ... | රබර් කෑන් | 1 යි |
| එම | ... | වීදුරු බූලි | 3 යි |
| එම | ... | කැති | 1 යි |
| ඒ 1817/72 | ... | හම්බර් බයිසිකල් ෆ්‍රේම | 1 යි |
| ඒ 46/73 | ... | හර්කියුලස් බයිසිකල් | 1 යි |
| 70968 | ... | සල්බාර් සබන් කුට්ටි | 1 යි |

7–279 –73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## හලාවත මහේස්ත්‍රාත් උසාවියේ භාණ්ඩ වෙන්දේසිය

රාජසන්තක කරන ලද සහ අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද පහත සඳහන් භාණ්ඩ කල්වේලා ඇතිව අයිතිවාසිකම් ඉදිරිපත් කර එම භාණ්ඩ ලබා නොගතහොත් එම භාණ්ඩ 1973 අගෝස්තු 6 වැනි දින පෙරවරු 8.30 ට හලාවත මහේස්ත්‍රාත් උසාවි භූමියේදී කුරුණෑගල ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්/අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරියෙකු ඉදිරිපිට දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වමි.

එම භාණ්ඩ වෙන්දේසි කරනු ලබන දින පෙ. ව. 8.00 ට උසාවි භූමියේදී පරීක්ෂා කළ හැක.

වෙන්දේසියේදී සාර්ථක ඉල්ලුම්කරුවන් විසින් මිළ දී ගන්නා ලද භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදීම නියමිත මුදල් ගෙවා එම භාණ්ඩ වහාම උසාවි භූමියෙන් ඉවත් කළ යුතුය.

එල්. එච්. පී. වීරසේකර,
හලාවත මහේස්ත්‍රාත්.

1973 ක් වූ ජූනි මස 21 වැනි දින,
හලාවත මහේස්ත්‍රාත් උසාවියේ දී ය.

වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ

| නඩු අංක | | විස්තරය |
|---|---|---|
| ඒ/ආර්. 8/71 | ... | අංක ඒ. එච්. 57574 දරණ රුලේ පාපැදිය |
| ඒ/ආර්. 66/73 | ... | අංක සී. එල්. 45167 දරණ රුලේ පාපැදිය |
| ඒ/ආර්. 105/72 | ... | අංක යි. වී. 22 දරණ රුලේ පාපැදිය |
| ඒ/ආර්. 137/72 | ... | අංක සී. යූ. 801 දරණ රුලේ පාපැදිය |
| ඒ/ආර්. 222/72 | ... | අංක සී. එම්. 65725 දරණ රුලේ පාපැදිය |
| ඒ/ආර්. 369/72 | ... | අංක 69 එම්. 768 දරණ බී. එස්. ඒ පාපැදිය |
| ඒ/ආර්. 368/72 | ... | අංක සී. ටී. 10331 දරණ රෝඩ්මාස්ටර් පාපැදිය |
| ඒ/ආර්. 370/72 | ... | අංක ටී. 51342 ඉදිරි රෝදය රහිත රුලේ පාපැදිය |
| ඒ/ආර්. 371/72 | ... | අංක ඒ. පී. 60528 දරණ රුලේ පාපැදිය |
| 22277 | ... | අංක එෆ්. ඊ. 69754 දරණ රුලේ පාපැදිය |
| 22803 | ... | අංක ඊ. ඊ. 2541 දරණ රුලේ පාපැදිය |
| 23011 | ... | අංක ඒ. ඒ. 2541 දරණ රුලේ පාපැදිය |
| 25630 | ... | අංක බී. ජී. 92405 දරණ රුලේ පාපැදියක් |
| | | අංක එම්. එන්. 7678 දරණ පාපැදිය |
| 29722 | ... | අංක බී. එන්. 2320 දරණ රුලේ පාපැදිය |
| 35070 | ... | අංක ඒ. ඊ. 609 දරණ පාපැදියක් |
| 37792 | ... | අංක ඊ. 591 දරණ පාපැදියක් |
| 38136 | ... | අංක එම්. ජී. 5015 දරණ පාපැදියක් |
| 28891 | ... | කෑලි තුනේ විදුලි පන්දමක් |
| 29396 | ... | උදැල්ල, මන්නා පිහිය |
| 29580 | ... | කැත්ත |
| 29777 | ... | මල් කපන පිහියක් |
| 29959 | ... | උදැල්ලක්, පොරවක් සහ කෙටේරියක්. |
| 30267 | ... | මන්නා පිහිය, පිහියක්. |
| 30369 | ... | සුදු පිඟන් 10 යි. |
| 30486 | ... | කැත්තක්. |
| 30939 | ... | පාකර් පෑනක්. |
| 30996 | ... | හබලක් සහිත ඔරුවක් |
| 31631 | ... | කැත්තක තලයක්. |
| 32242 | ... | පොඩි මන්නා පිහියක්. |
| 32544 | ... | විදුලි පන්දමක්. |
| 33662 | ... | මන්නා පිහියක්. |
| 35896 | ... | පිඟන්, මවුත්ඕගන්, වීදුරු, රෙදි, කෝල්ට් වර්ගයේ විදුලි පන්දම යනාදිය. |
| 36029 | ... | ඔරුව. |
| 36092 | ... | වික්ස් වේපෝරබ් ඇවුරුමක්. |
| 36093 | ... | වික්ස් වේපෝරබ් ඇවුරුම් 2 යි. |
| 36481 | ... | කෑලි දෙකේ එවරෙඩි විදුලි පන්දමක්. |
| 36650 | ... | බීර බෝතල් 6 යි. |
| 36975 | ... | මිරිස් අඹරන ගලක්. |
| ඒ/ආර්. 119/72 | ... | ඔරු 3 යි. |
| ඒ/ආර්. 150/73 | ... | බෝල නූල්, සෙල්ලම් බඩු, කන්නාඩි, පවුඩර් ටින්, පනා, මැන්ටල්, වීදුරු සෝකේස් 1 යි, පොඩි මේස 3 යි, සූට් කේස් 1 යි යනාදිය. |
| ඒ/ආර්. 162/73 | ... | රුවන් වර්ගයේ ඇලි පිහි 9 යි. (2) පයිලට් පෑන් 10 යි. (3) රුවන් වර්ගයේ ඇලි පිහි 6 යි. (4) කොන්ඩ කපන මැෂින් එකයි. (5) මධ්‍යම ප්‍රමාණයේ පනා 18 යි. (6) කිටල් වර්ගයේ පොඩි පනා 140 යි. (7) ක්‍රිසිනෝ වර්ගයේ ගෑන පනා 8 යි. |
| ඒ/ආර්. 184/72 | ... | කබක්ක වර්ගයේ දන්වැලක්. |
| ඒ/ආර්. 185/72 | ... | කේම්බ්‍රිජ් රෙදි යාර 2 යි. |
| ඒ/ආර්. 259/71 | ... | ජැක් 1 යි. |
| ඒ/ආර්. 327/72 | ... | පිඟන් දීසි, වීදුරු. පෝච්චි, කෝප්ප, මේස, හැඳි, ගෑරුප්පු, පවුඩර් ටින්, නූල් රෝද යනාදිය. |
| 6328 | ... | අත් ඔර්ලෝසුවක් සහ එවරෙඩි විදුලි පන්දමක්. |

| නඩු අංකය | විස්තරය |
|---|---|
| 13143 | ... අංක ඊ. එල්. 451568/15297 සිංගර් පාගන මැෂිමක්. |
| 13370 | ... මන්නා පිහි 2 යි. |
| 22688 | ... ලී දොරක්. |
| 24093 | ... තන කොළ කපන කැත්තක්. |
| 24988 | ... කැත්තක් |
| 25110 | ... කැලි තුනේ විදුලි පන්දමක්. |
| 25233 | ... මන්නා පිහියක්. |
| 26331 | ... කැත්තක්. |
| 26432 | ... කබක්ක කරාබු කූට්ටමක්. |
| 27833 | ... පිහිය. |
| 28048 | ... මන්නා පිහියක්. |
| 28138 | ... කැත්තක්. |
| 28820 | ... මන්නා පිහියක්. |
| 28865 | ... නැමි පිහියක්. |
| | විදුරු ඇසිට් ජාර්. |
| | දිස්පැන්සරි විදුරු බෝතල්. |
| | ඇලුමිනියම් ලොකු සහ කුඩා මුට්ටි. |
| | ලොකු ටින් බැරල් සහ කුඩා ටින් බැරල්. |
| | ප්ලාස්ටික් කුඩා ප්‍රමාණයේ සහ ලොකු ප්‍රමාණයේ. |
| | ඇලුමෙනියන් බේසන් යනාදිය. |
| | තාච්චි යනාදිය. |
| | ඩ්‍රැම්ස් 8 විදුරු බෝතල් යනාදිය. |

7–360—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### පොලිස් දෙපාර්තමේන්තුව

කුලියාපිටිය සහකාර පොලිස් අධිකාරී කාර්යාලයේදී 28.7.1973 දින පෙ.ව. 9.00 ට පහත සඳහන් බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| අංකය | | බඩුවල විස්තර | | | ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1 | ... | ඩී.ඇම්. 79700 | (60/41) රලේ පාපැදි | ... | 1 |
| 2 | ... | ඩී.සී. 2674 | (423/56) එම | ... | 1 |
| 3 | ... | සී.බී. 535 | (166/54) එම | ... | 1 |
| 4 | ... | සී.බී. 531 | (115/54) එම | ... | 1 |
| 5 | ... | ඩී.සී. 2682 | (425/56) එම | ... | 1 |
| 6 | ... | සී.ජේ. 98466 | (77/55) එම | ... | 1 |
| 7 | ... | ඩී.සී. 2788 | (423/56) මොනරා | ... | 1 |
| 8 | ... | ඩී.සී. 2781 | (430/56) රලේ | ... | 1 |
| 9 | ... | බී.කේ. 137 | (186/62) මොනරා | ... | 1 |
| 10 | ... | ඩී.කේ. 91040 | (55/59) රලේ | ... | 1 |
| 11 | ... | ඩී.සී. 2687 | (427/56) එම | ... | 1 |
| 12 | ... | ඩී.සී. 2677 | (426/56) එම | ... | 1 |
| 13 | ... | බී.කේ. 478 | (182/62) මොනරා | ... | 1 |
| 14 | ... | බී.කේ. 200 | (252/62) එම | ... | 1 |
| 15 | ... | ඒ.සී. 414 | (32/61) එම | ... | 1 |
| 16 | ... | ඩී.කේ. 261 | (42/62) එම | ... | 1 |
| 17 | ... | ඒ.සී. 10 | (25/61) එම | ... | 1 |
| 18 | ... | ඩී.ඇම්. 79701 | (60/40) රලේ | ... | 1 |
| 19 | ... | ගැලුම් 4 රේ හිස් ටින් | ... | ... | 52 |
| 20 | ... | ගැලුම් 1 කේ හිස් ටින් | ... | ... | 42 |
| 21 | ... | ගැලුම් 5 හේ රවුම් හිස් ටින් | ... | ... | 2 |

ඉහත සඳහන් බඩු බාහිරාදිය 27.7.73 දින පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා කාලය තුලදී ස.පොලිස් අධිකාරී කාර්යාලයේදී බලා ගත හැක.

සී. අම්බිහාපති,
සහකාර පොලිස් අධිකාරී, කුලියාපිටිය

1973 ජූනි මස 20 වැනි දින,
කුලියාපිටිය පොලිස් කාර්යාලය.

7–280—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ නොවන දැන්වීම්

### දැන්වීමයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩවිල්ලි හත්පත් තුවේ මහගල්බඩ මෙගොඩ කෝරළේ රංගම පදිංචි වීරසේකර මුදියන්සෙලාගේ කිරිබණ්ඩා වීරසේකර වන මම සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු ලෙස කටයුතු කිරීම පිණිස ඇතුළත් කර ගන්නා ලෙස නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීම සඳහා ගරු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපනතේ 107 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තියේ පළමුවැනි උපලේඛනයේ "ආ" කොටසේ දෙවැනි නියෝගය පරිදි සියලු දෙනා වෙත මෙයින් ගෞරවයෙන් දන්වා සිටිමි.

මෙයට,

රංගම, වැල්ලව. ඩබ්ලිව්. ඇම්. කේ. බී. වීරසේකර.
1973 ජූලි මස 2.

7–395—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් කරගන්නා ලෙස කරන ලද ඉල්ලීමේ දැන්වීමයි

කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙණි හත්පත් තුවේ උඩපොල මැද ලස්සේ කෝරලේ බැවිල්ගමුවේ පදිංචි සමරකෝන් මුදියන්සෙලාගේ උක්කුබණ්ඩා සමරකෝන් වන මම මෙදින සිට පූරා මාසයක් ගත වූ පසු කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරණ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුලත් කර ගන්නා මෙන් වර්ෂ 1907 අංක 1 දරණ නොතාරිස් ආඥපනතේ 7 වෙනි වගන්තියේ දක්වන නියෝගය පරිදි නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස අවසර දෙන ලෙස ගරු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දන්වමි.

බැවිල් ගමුව, පොතුහැර.
1973.7.2. යූ. බී. සමරකෝන්.

7–394 –73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

කොළඹ දිස්ත්‍රික්කයේ පන්නිපිටියේ දෙපානම දේවාල පාරේ අංක 381 දරණ ස්ථානයෙහි දැනට පදිංචි කිරිවල ගමගේ මාටින් වන මම ගාළු දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් පත්වීම් පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා මෙවක් පටන් මාසයක් ගත වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව වර්ෂ 1907 අංක 1 දරණ නොතාරිස් ආඥපනතේ 1 වන උපලේඛනයේ "ආ" කොටසේ 2 වැනි නියෝගය ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

කේ. ජී. මාටින්,
ප්‍රතිඥාත ලිපිකරු.

1973.7.2,

7–393—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

කොළඹ දිස්ත්‍රික්කයේ වත්තල දැනට පදිංචි පරන හේවාගේ ජිනදාස වන මම මාතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් වැඩ කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙක් මෙන් පත්වීම සඳහා වර්ෂ 1973 හි ඔක්තෝබර් මාසයේ පැවැත්වෙන නොතාරිස්වරුන් පිළිබඳ අවසාන විභාගයට පෙනී සිටීමට මෙවක් පටන් මාසයක් ගතවූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා ගෙන් ඉල්ලා සිටින බව වර්ෂ 1907 තේ අංක 1 දරණ නොතාරිස් ආඥපනතේ පළමුවන උපලේඛනයේ "ආ" කොටසේ 2 වැනි නියෝගයේ ප්‍රකාර මෙයින් දන්වමි.

මෙයට,
පී. එච්. ජිනදාස,
ප්‍රතිඥාත ලිපිකරු.

1973 ජූලි මස 2 දිනදීය.

7–381—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

**දැන්වීමයි**

ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කයේ මන්ඩාවල "සෝමවිලා" හි පදිංචි සිරිසේන රාජකරුණා වන මම අද දින සිට මාසයක් ගතවී මෙන් පසු කොළඹ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් පත් කරනු ලැබීමට රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් වරුන පිළිබඳ වූ 107 වැනි අධිකාරයේ 7 වැනි වගන්තියේ පළමුවැනි උපලේඛනයේ (ආ) කොට්ඨාශයේ 2 වැනි ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

එස්. රාජකරුණා.

1973 ජුලි 2.

7–376—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

කළුතර දිස්ත්‍රික්කයේ බැල්ලපිටියේ දනට පදිංචි හෙට්ටිආරච්චි ගේ දොන් ඊඩින් ගුණසිරි වන මම, කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් වැඩ කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුමෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් වරුන්ගේ අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා මෙවක් පටන් මාසයක් ගතවූ තැනදී රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලුම්කර සිටින බව වර්ෂ 1907 අංක 1 දරණ නොතාරිස් ආඥාපනතේ 1 වෙනි උපලේඛනයේ "ආ" කොටසේ 2 වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

මෙයට,
එච්. ඞී. ඊ. ගුණසිරි.

1973 ජුලි මස 2 වෙනි දින,
හොරණ, බැල්ලපිටියේ දීය.

7–375—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

විතුගෙදර පරගහතොට පදිංචි කලුතන්තිරි පටබැඳි විජිත්ද සිල්වා වන මම මෙවක් සිට මාසයක් ගත වූ පසු බලපිටිය අධිකරණ කොටසෙහි සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු ලෙස ඇතුළත් කර ගන්නා මෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

කේ. පී. විජිත් ද සිල්වා.

1973 ජුනි මස 29 දින.

7–406—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ ගොඩගේතේ පදිංචි අරුමාවඩු සුමනසිරි වන මම අද දින සිට පූරා මාසයක් ගත වූ පසු ගාලු දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 වන පරිච්ඡේදයේ 7 වැනි වගන්තියේ පළමුවන උපලේඛනයේ (ආ) කොටසේ 2 වැනි නියෝගය ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඒ. ඩබ්ලිව්. සුමනසිරි,

1973 ජුනි මස 27 වෙනි දින,

7–411—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස ඉල්ලීමයි**

හික්කඩුව, සීනිගම පදිංචි අගම්පොඩි කල්‍යාණවතී වන මම, අද සිට මසක් ගතවූ පසු ගාලු දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු ලෙස ඇතුළත් කරගන්නා මෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර රජයට සහ මහජනයාටත් මෙයින් දැනුම් දෙමි.

ඒ. පී. කල්‍යාණවතී.

සීනිගම, හික්කඩුව,
26. 6. 73.

7–436—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

වේරගොඩ පදිංචි වන්නිආරච්චි කංකානම්ගේ ප්‍රේමදාස වන මම මේදින සිට මාසයක් ගතවූ පසු නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඩබ්ලිව්. කේ. ප්‍රේමදාස.

1973 ජුලි මස 4 වෙනි දින,
වේරගොඩ, ඝනව.

7-407—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

අම්බලම්ගොඩ, පටබැඳිමුල්ලේ පදිංචි නයිදුවාහන්දි පියදාස වන මම මෙදින සිට මාසයක් ගත වූ පසු නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මීට,
ඇන්. එච්. පියදාස.

1973. 7. 4,
පටබැඳිමුල්ල,
අම්බලම්ගොඩ.

7–408—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**බෙදුම් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්**

මාතර දිස්ත්‍රික් උසාවියේදිය

**කෝට්ටගොඩ පදිංචි පුංචිහේවාගේ කරෝහාමි...දෙවැනි පැමිණිලිකාරි.**

අංක පී. 1825 එදිරිව

1. කෝට්ටගොඩ පදිංචි මරක්කලමානගේ අරනෝලිස් අප්පු සහ තවත් විත්තිකාරයෝය.

ඉහතකී නඩුවෙන් මට ලැබී තිබෙන බලය පිට මෙහි පහත සඳහන් දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ වර්ෂ 1973 ක්වූ අගෝස්තු මස 18 වෙනි දින සවස 4.30 වෙන්දේසියේ විකුණනු ලැබේ.

තක්සේරු මිල රුපියල් 4,791.00.

ඉඩම් විස්තරය

දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩපත්තුවේ කෝට්ටගොඩ පිහිටි කඩේඅද්දර මිදිගහකොරටුවේ බෙදාවෙන් කල 'බී' අක්ෂරය දරන ඉඩමට මායිම්, උතුරට මෙම ඉඩමේ 'ඒ' අක්ෂරයද, නැගෙනහිරට මහපාරද, දකුණට මෙම ඉඩමේ 'සී' අක්ෂරයද, බස්නාහිරට මෙම ඉඩමේ 'සී' අක්ෂරයද, යන මායිම් තුල පර්චස් හයකුත් දශම හතයි හයක් විශාල ඉඩම සහ එහි පිහිටි සියලු ගස කොළ පළතුරුද වේ. එය ඈන්'. විජේවීර මිණින්දෝරු මහතා විසින් සාදන ලද 889 දරන බී 1සහ බී වශයෙන් හඳුන්වනු ලැබේ. වැඩි විස්තර ජයපාල සමරසිංහ නීතිඥ මහතාගෙන් හෝ මගෙන් ලබාගත හැකිය.

1973 ජුනි 10
'කීර්ති'
හිත්තපිය, මාතර,

ජාන් ද සිල්වා සපුකොටන,
වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

7–382/1—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

### මාතර දිස්ත්‍රික් උසාවියේ දීය

ණය නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

කැකනදුරේ පදිංචිව සිට නැසී ගිය බර්ට්‍රම් ජෝර්ජ් බුල්ජන්ස් ........................................................................පැමිණිලිකාරයා.

කැකනදුරේ පදිංචි බෙක්මින් බුල්ජන්ස් පත් කළ පැමිණිලි කරු

අංක එම්. බී. 1826 එදිරිව

1\. පඹුරන පදිංචි ලීලාවතී ඩයස් ජයසේකර............................ සහ තවත් විත්තිකරුවෝ.

ඉහත කී නඩුවේ මට ලැබී තිබෙන බලය පිට 1 වෙනි විත්තිකරු ගෙන් පැමිණිලිකාරයින්ට අය විය යුතු නඩු තීන්දුවේ මුදල වන රුපියල් 11,640.82 ක්ද, ගෙවන දින දක්වා නීති පොලියද, අය කර ගැනීම පිණිස මෙහි පහත සඳහන් දේපල වර්ෂ 1973 ක් වූ සැප්තැම්බර් මස 15 වෙනි දින උදේ 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉඩම් විස්තරය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත් සතර තුල මාතර නගර සීමාව ඇතුලත වරිපනම් අංක 3408 දැනට ශාලු පාරේ පඹුරන වරිපනම් අංක 443 දරන ඩී. රාජපක්ෂ අවසර ලත් මිනින්දෝරු මහතා විසින් සාදන ලද නොම්මර 303 සහ 13. 10. 1941 දරන සැලැස්ම සඩදාසියේ අපතෙන සුද්දන්ගෙ වත්ත නොහොත් සොප්පානියගෙ වත්තේ බෙදා වෙන් කල ලොට් 2 "ඒ" දරන කැබැල්ලට මායිම් උතුරට මහපාරද, නැගෙණහිරට එකී සැලැස්මේ ප්‍රකාර සඳහන් කරන ලද බී "2" දරන කැබැල්ලද, දකුණට එම ඉඩමේ එම සැලැස්මේ සඳහන් බී "2" දරන කැබැල්ලද, බස්නාහිරට එම ඉඩමේ ලොට් නොම්මර 1 දරන කැබැල්ල වන සුද්දගෙ වත්ත නොහොත් සොප්පානියගෙ වත්ත වන රූඩ් 1 ක් විශාල ඉඩම සහ එහි තිබෙන සියලුම ගොනැගිලිද, එහි උතුරටද, නැගෙනහිරටද, දකුණු පැත්තටද, තිබෙන කම්බි වැටවල් ද, සියලුම ගස කොල පලතුරුද වේ.

වැඩි විස්තර මාතර නීතිඥ ඇස්. ඇස්. ඇම්. ධීරරත්න මහතාගෙන් හෝ මගෙන් විමසන්න.

මාතර.

29.6.1973.

ජාන් ද සිල්වා සපුකොටන,
උසාවියේ වෙන්දේසිකාර කොමසාරිස් තැන.

7-382/2—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### මාතර දිස්ත්‍රික් උසාවියේ දීය

බෙදුම් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

මාතර පටබැඳිගේ චන්ද්‍රසිරි, කොටුවෙගොඩ, මාතර පැමිණිලිකරු.

අංක ප. 6819 එදිරිව

1\. මාතර පටබැඳිගේ ලීලාවතී, පල්ලිමුල්ල සහ තවත් විත්තිකාරයෝ.

ඉහත කී නඩුවෙන් මට ලැබී තිබෙන බලය පිට මෙහි පහත සඳහන් දේපල 1973 ක් වූ අගෝස්තු මස 11 වෙනි දින උදේ 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තක්සේරු මිල රුපියල් 14,229.50 සි.

ඉඩම් විස්තරය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර නගර සභාව සීමාව තුල කොටුවේගොඩ, පල්ලිමුල්ලේ සම්බෝධි මාවතේ පිහිටි වරිපනම් අංක 282 දරන බොයිටර නෝනාගේ වත්ත නොහොත් බොයිසර නෝනාගේ වත්තේ බෙදා වෙන්කල "ඒ" අක්ෂරයට බස්නාහිර දෙකෙන් පංගු කැබැල්ලේ බෙදා වෙන් කල අංක 1 නමැති කැබැල්ලට මායිම් : උතුරට කරදගහ කොරටුවද, නැගෙනහිරට බොයිටර නෝනාගේ වත්ත හොහොත් බොයිසර නෝනාගේ වත්තේ "බී" අක්ෂරය දරන කැබැල්ලද, දකුණට මෙම ඉඩමේ අංක 2 සහ 6 දරන කැබලිද බස්නාහිරට පල්ලියේ වත්ත සහ උලුගේ වත්තද, යන මායිම් වූ පර්චස් 20.25 ක් විශාල ඉඩම වේ. මෙම නඩුවේ කොමසාරිස් වන මාතර බලයලත් මිනින්දෝරු ජේ. පී. අමදෝරු මහතා විසින් සාදන ලද අංක 357 සහ 1902 ක්වූ පෙබරවාරි මස 26 වෙනි දින දරන පිඹුරේ අංක 1 ලෙස විස්තර කරන ලද ඉඩමේ කැබැල්ලය. වැඩි විස්තර තිලකොලත් මහෙස්ත්‍රාත් සමාදාන විනිසුරු සහ නීතිඥ සේපාල සමරසිංහ මහතාගෙන් හෝ මගෙන් විමසන්න.

ජාන් ද සිල්වා සපුකොටන,
උසාවියේ වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.

මාතර,

27\. 6. 1973.

7-382/3—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### මාතර දිස්ත්‍රික් උසාවියේ දීය

බෙදුම් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

දෙවුන්දර පදිංචි බැනිස්ටර් ද සිල්වා තෝනබදු .............................................................................. පැමිණිලි කරු.

අංක පී. 2544 එදිරිව

ගල්කිස්සේ ශාන්ත රීටාස් පාරේ අංක 39 පදිංචි සෝමවතී තෝනබදු ............................................................ සහ තවත් විත්තිකාරයෝ.

ඉහත කී නඩුවෙන් මට ලැබී තිබෙන බලය පිට මෙහි පහත සඳහන් දේපල වර්ෂ 1973 ක්වූ අගෝස්තු මස 18 වෙනි දින උදේ 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තක්සේරු මුදල රුපියල් 20,525.

ඉඩම් විස්තරය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ දෙවුන්දර පිහිටි පැලවත්ත නැමති ඉඩමට මායිම් : උතුරට දේවගෙ පාරද, නැගෙණහිරට අම්පිටිය වත්ත සහ මෙම ඉඩම වෙන් කෙරෙන කම්බි වැටද, දකුණට ලුනු වත්තද, බස්නාහිරට අංක 3 සහ 4 දරනා ගොඩනැගිලි වල බස්නාහිර බිත්තියද, මායිම් වූ පර්චස් 17 ක් විශාල ඇති මෙම නඩුවේ කොමසාරිස් වන ඇස්. වික්‍රමසූරිය මහතා විසින් සාදන ලද අංක 740 සහ 1961. 1. 10 දින දරන "එක්ස්" යනුවෙන් සලකුණු කල පිඹුරේ "ඒ" අක්ෂරය ලෙස විස්තර කරන ලද ඉඩම සහ සියලු ගොඩනැගිලි සහ පලතුරුද වේ.

වැඩි විස්තර ඒ. පී. බී. සහ ඒ. පී. ඩබ්ලිව්. නීතිඥ මහතුන්ගෙන් හෝ මගෙන් විමසන්න.

ජාන් ද සිල්වා සපුකොටන,
උසාවියේ කොමසාරිස්
සහ වෙන්දේසිකාර තැන.

30\. 6. 1973,

මාතර.

7-382/4—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### මාතර දිස්ත්‍රික් උසාවියේ දීය.

බෙදුම් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

කනත්තගොඩ මාතර ලොකුකලුගේ පියදාස..............පැමිණිලිකරු.

නඩු අංක පී 5112 එදිරිව

මාතර නීතිඥ බී. පී. පියසේන මහතා ...................... සහ තවත් විත්තිකරුවන්.

ඉහත කී නඩුවෙන් මට ලැබී තිබෙන බලය පිට මෙහි පහත සඳහන් දේපල වර්ෂ 1973 ක්වූ අගෝස්තු මස 4 වෙනි දින උදේ 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තක්සේරු මිල රුපියල් 3,213.50.

ඉඩම් විස්තරය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත් සතර තුල හිත්තටියේ පිහිටි බෙදා වෙන් කල ඉදි පිට්ටනියේ මහබෝගහ ඕවිට නැමති ඉඩමේ "ඇෆ්" දරන කැබැල්ලට මායිම්' උතුරු නැගෙනහිරට මහ පාරද, නැගෙනහිරට ඉදි පිට්ටනියේ මහබෝගහ ඕවිට "ජී" කැබැල්ලද, බස්නාහිරට : උස්ඹවිට සහ මැදඹවිටද, උතුරු බස්නාහිරට : අස් කරන ලද මේ ඉඩමේ "බී" අක්ෂරයද, යන පර්චස් 10.90 ක් විශාල පී. ද ඇස්. විජේරත්න මිනින්දෝරු මහතා විසින් සාදන ලද 412 අංකය 1962.3.27 දරන සැලැස්මේ ප්‍රකාර "සී" අක්ෂරය ලෙස හඳුනන ඉඩම වේ.

වැඩි විස්තර ඒ. ඊ. බුල්ජන්ස් නීතිඥ මහතාගෙන් හෝ මගෙන් විමසන්න.

ජාන් ද සිල්වා සපුකොටන,
උසාවියේ වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

මාතර,

27.6.1973.

7-382/5—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

### මාතර දිස්ත්‍රික් උසාවියේදීය

උගස් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

මාතර නුපේ පදිංචි ලියනගේ ලෙට් පෙරේරා........පැමිණිලිකරු.
නො. ඇම්. බී. 1850 එදිරිව

නැසිගිය වික්ටර් රණසිංරණවකගේ බූදලයේ නීත්‍යානුකූල නියෝජිත දෙනියායේ කන්දිල්පානේ පදිංචි මාලිනී රණසිංරණවක, විවාහයට පෙර රාජකරුණා...........විත්තිකාරි.

ඉහත කී නඩුවෙන් මට ලැබී තිබෙන බලය පිට ඉහත සඳහන් විත්තිකාරියගෙන් පැමිණිලිකාරයාට අය විය යුතු රුපියල් 8,839.00 ක් සහ රුපියල් 6,500.00 ක්වූ මුල් මුදලට වර්ෂ 1968 ක්වූ ජූනි මස 6 වෙනි දින සිට 1972 ක්වූ ඔක්තෝබර් 25 වෙනි දින දක්වා සියයට 10 යේ පොලියට වර්ෂ 1972 ක්වූ ඔක්තෝබර් මස 26 වෙනි දින සිට එකී මුල් මුදල හා පොලියටද, එක්තු කල මුළු මුදල ගෙවා අවසන් වන දින තෙක් එකී මුදලට නීත්‍යානුකූල පොලියද, මෙම උසාවියේ නිලධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තුවද, "උසාවියෙන් තක්සේරු නොකරන ලද බිල රුපියල් 352.59 යි" ගෙවිය යුතු යයි මෙයින් නියෝග කර තීන්දු ප්‍රකාශ කර තිබේ. එබැවින් එකී මුදල විත්තිකරුගෙන් අය කර ගැනීම සඳහා මෙහි පහත සඳහන් දේපල වර්ෂ 1973 ක්වූ අගෝස්තු මස 25 වෙනි දින පළමුවන ඉඩම උදේ 11 ටද දෙවැනි ඉඩම උදේ 11.30 ටද, තෙවැනි ඉඩම දහවල් 12 ටද පිළිවෙළින් විකුණනු ලැබේ.

ඉඩම් විස්තරය

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, මතු ගොබේ පිහිටි පිටවල නොහොත් මහදෙණිය නැමති ඉඩමේ බෙදා වෙන් කල අංක 5 දරන ඉඩමට මායිම්—උතුරට: මෙම ඉඩමේ අංක 1 දරන කැබැල්ලද, නැගෙනහිරට: එම ඉඩමේ අංක 6 දරන කැබැල්ලද, දකුණට: පල්ලෙගමට යන පාරද, බස්නාහිරට: එම ඉඩමේ අංක 3 දරන කැබැල්ලද මායිම් වූ පර්චස් විසිඑකකුත් දශම පහක් (පර්චස් 21.5 ක්) විශාලත්වය ඇති ඉඩමේ ගහ කොල පලතුරු සමග බිම සහ එහි ඇති ගොඩනැගිලිද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එප් 172/279 වැනි පොතේ ලියාපදිංචිව ඇත.

2. මොරවක්කෝරළේ, උඩුවක මතුගොබේ පිහිටි පිටිවල නොහොත් මහ දෙණිය නැමති ඉඩමේ බෙදා වෙන් කල අංක 9 දරන ඉඩමට මායිම්—උතුරට: එම ඉඩමේ අංක 1 දරන කැබැල්ලද, නැගෙනහිරට: එම ඉඩමේ අංක 10 දරන කැබැල්ලද, දකුණට: පාරද, බස්නාහිරට: මෙම ඉඩමේ අංක 8 දරන කැබැල්ලද, මායිම් වූ පර්චස් 21 යි දශම 5 ක් (පර්චස් 21.05) විශාලත්වය ඇති කැබැල්ලේ ගහ කොල පලතුරු සමග බිමෙන් නොබෙදූ හතරෙන් තුන් පංගුව සහ එහි ඇති සියලුම ගොඩනැගිලි සම්පූර්ණයෙන්ද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලේඛනාගාරයේ ඇප්. 162/90 පොතේ ලේඛන ගතව ඇත.

3. මොරවක්කෝරළේ, උඩුවක මතුගොබේ පිහිටි පිටදෙණිය කැබැල්ල නැමති ඉඩමට මායිම්—උතුරට: පාර සහ අර්නෝලිස් සිල්වා පදිංචි කැබැල්ලද, නැගෙනහිරට: තල්ගහ කුඹුරද, දකුණට: කරලගිත්ගෙ ගෙදර වත්තද, බස්නාහිරට: පාරද, මායිම් වූ වී කුරිනි දොළහක වපසරිය ඇති ඉඩමේ ඉහත කී ණය කරු වන වික්ටර් රණසිංරණවකගේ අයිතිය හෝ අයිතිවාසිකම් සහ හිමිකම් වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලේඛනාගාරයේ එප්. 170/42 පොතේ ලේඛන ගතව ඇත. වැඩි විස්තර සී. ඩී. සමරසේකර නීතිඥ මහතාගෙන් හෝ මගෙන් ලබා ගන්න.

ජාන් ද සිල්වා සඳුකොටන,
වෙන්දේසිකරු
සහ උසාවියේ කොමසාරිස් තැන.

මාතර,
30.6.1973.

7–382/6—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රසිද්ධ වෙන්දේසිය

(ජාතික නිවාස පනත යටතේ විකිණීමයි)

ජාතික නිවාස සහකාර කොමසාරිස් රෙගිස් සුන්දරම් ජෝගේන්ද්‍රා මහතා විසින් මා වෙත නිකුත් කරන ලද 1973.03.02 දින සහ අංක නීති/ණ/855 දරන බලය පිට, ඒ. සංගරපිල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1960.03.26 දින අංක 8679 දරන උකස් කරය යටතේ මුදල් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, කල්පිටියේ පෙරියකුඩිරිප්පුවේ ඇම්. ඇන්. ඇම්. පී. ඇන්. මරික්කාර් මහතාගෙන් 69.07.26 දිනතෙක් අයවිය යුතුවූ රුපියල් පහළොස් දහස් පන්සිය හතලිස් දෙකයි ශත අසූ පහ (රු. 15,542.85) 69.06.19 වන දිනට පසු ගෙවන ලද මුදල් හැර අයකරගැනීම සඳහාත්, එසේම 69.07.26 දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රුපියල් නව දහස් දෙසිය (රු. 9,200)ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල වර්ෂයකට සියයට 3 3/4 ප්‍රමාණයට යථෝක්ත උකස්කරය ප්‍රකාර 69.07.26 වන දින සිට විකිණීමේ දිනය තෙක් එකතුවන සියලුම දඩ මුදල් සමග අයකර ගැනීමත්, එසේ අයකර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මීට අමුනා ඇති උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියලුදේත් 1973 අගෝස්තු මස 4 වන දින පස්වරු 3.30 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බැව් මෙයින් දන්වමි.

මේ පිළිබඳව වැඩි විස්තර මාගෙන් හෝ කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ ජාතික නිවාස කොමසාරිස්වරයාගෙන් හෝ විමසන්න.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, කල්පිටියේ, කල්පිටිය කොට්ඨාශයේ, කල්පිටිය නාගරිකයේ, පෙරියකුඩිරිප්පුවේ පිහිටි බලපත්‍රධාරි මිනින්දෝරු සී. ඇස්. වීරවේල් මහතා විසින් සම්පාදිත 1958 ඔක්තෝබර් 1 වන දින අංක 326 දරණ පිඹුරේ අංක 1 සහ 2 කට්ටි වශයෙන් සඳහන් කර ඇති පාර්චස් තිස් හතක (37) බිම් ප්‍රමාණයක් අන්තර්ගත දැනට නැගෙනහිරට ඇස්. නාගූර්පිච්චෙයිගේ සහ ඇම්. හබීබ් මොහම්මදුගේ ඉඩම්වලින්ද, උතුරට ඒ. මීස්කින් පිච්චෙයිගේ සහ ඇස්. නාගූර් පිච්චෙයිගේ සහ තේ. පට්ටානිගේ ඉඩම්වලින්ද දකුණට සහ බස්නාහිරට පාරවල්වලින්ද මායිම්වූ එහි ගොඩනගන ලද නිවාසයද සහිතව එකම දේපලක් බවට පත්ව ඇති තක්සේරු අංක 4 සහ 6 දරන "කදිරුම්මාකානි" සහ "කිනත්තඩිකානි" නමැති යාබද ඉඩම් කොටස් දෙකේ සියල්ල.

සී. වික්‍රමසිංහ,
ප්‍රසිද්ධ වෙන්දේසිකාර, තක්සේරුකරු සහ බ්‍රෝකර්.

1973 ජූනි මස 12 වනදා,
100, කෙලින් වීදිය,
පුත්තලම.

7–370—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## විවිධ දැන්වීම්

### ලක්සල සංකේතය

ලක්සල, සිය ස්වභාවය පිළිඹිබු කැරෙන සංකේතයක් පාවිච්චි කිරීමට අදහස් කරයි. එම සංකේතය චිත්‍රයෙන් හෝ වාක් මාලාවකින් හෝ ඒ දෙකෙහිම සංකලනයෙකින් යුත් සමන්විත විය යුතුයි.

නිසි සංකේතය ඉදිරිපත් කරන කලාකරුට රුපියල් දෙසිය පණහක ත්‍යාගයක් ප්‍රදානය කැරේ.

සියලු චිත්‍ර ලියා පදිංචි තැපැලෙන් 1973 අගෝස්තු මස 8 වැනිදට හෝ ඊට පෙර හෝ පහත දැක්වෙන ලිපිනයට එවිය යුතුයි.

කුඩා කර්මාන්ත අධ්‍යක්ෂගේ තීරණය අවසාන තීරණයයි. ලිපි හුවමාරු නොකැරේ.

කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව.

හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.

7–392—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... 73.06.27 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... 73.07.04 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... 73.07.11 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... 73.07.18 | බදාදා | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... 73.07.25 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... 73.08.01 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... 73.08.08 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... 73.08.15 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | .. 73.08.22 | බදාදා | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... 73.08.29 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... 73.09.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... 73.09.11 | බදාදා | දවල් | 12.00 |
| | 73.09 28 | සිකුරාද | ... 73.09.19 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. ෂී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.